විදේශිකයින්ට සහ මෙරට ව්‍යාපාරිකයින්ට කාන්තාවන් ලිංගික ශ්‍රමිකයින් ලෙසට අලෙවි කරනවා යැයි පැවසෙන ජාවාරමක් සම්බන්ධයෙන් තොරතුරු හෙළි කරගත් මධ්‍යම දූෂණ මර්දන ප්‍රහාරක බලකාය විසින්, 7 දෙනෙකු අත්අඩංගුවට ගත් පුවත, පුවත්පත් කිහිපයකම වාර්තා වී තිබිණි.
ඒ සම්බන්ධයෙන් විවිධ පුවත් වාර්තාවන් තුළ සඳහන්ව තිබූ ආකාරය පහත පරිදි දැක්විය හැක.
* දිනමිණ - "අරගල ලොක්කාගේ ජංගම ගණිකා මඩම මාට්ටු"
* ලංකාදීප - "අරගලයේ සංවිධායකයකුගේ ගණිකා ජාවාරම වටලයි"
* අරුණ - "මොරටුව අරගලකරුගේ රෝද හතරේ ගණිකා ජාවාරම"
* මව්බිම - "ෂෝට් ලීව් දමා කාර්යාල සේවිකාවන් ගණිකා ව්‍යාපාරයේ යොදන ජාවාරමක්"
ඔබේ අදහසට අනුව,
1) මෙහිදී අත්අඩංගුවට ගැනුණු සැකකරුවෙකු, "අරගලයේ ක්‍රියාකාරිකයෙකු" වීම, මෙම සිදුවී ඇතැයි පැවසෙන ලිංගික ශ්‍රමික ජාවාරමට අදාළ වන්නේ කෙසේද?
2) අදාළ නොවේ නම්, මෙම පුවත ඉදිරිපත් කරන ඇතැම් පුවත්පත්, සිරස්තල තුළම "අරගලය" සම්බන්ධයෙන් සඳහන් කිරීමේ පදනම කුමක්ද? එය "අරගලය" අපරාධකාරී ක්‍රියාවන්ට සම්බන්ධ කිරීමට සහ, "අරගලය" සහ ඊට සහභාගී වූ ඕනෑම අයෙකු පිළිබඳව අවමානයෙන් යුතුව සැලකුම් කිරීමේ ආකල්පයක් ඇති කිරීමේ ප්‍රයත්නයක් ද? (එවැනි ප්‍රයත්නයන් පිළිබඳව Ethics Eye අපි මින් පෙරද විමසා ඇත්තෙමු.)
3) ඒ අනුව, මෙම පුවත වඩාත් අපක්ෂපාතීව වාර්තා කර ඇති පුවත් වාර්තාව(න්) ලෙසින් ඔබ තෝරාගන්නේ කුමක්ද?
(මෙහි සඳහන් වන " ගණිකා"සහ "සුරූපී" යන යෙදුම් සම්බන්ධයෙන් ද, අපි වෙනත් පෝස්ටුවකින් සාකච්ඡා කරන්නෙමු.
අදාළ නොවන සන්දර්භයන් තුළ "අරගලය" හා ඊට සහභාගී වූවන්ව අවමානාත්මකව දැක්වීම් පිළිබඳ අපි මින් පෙර සිදුකළ ප්‍රශ්න කිරීම් වෙතට මෙතැනින් පිවිසෙන්න:
https://www.facebook.com/.../a.23402767.../1944538695901178/
https://www.facebook.com/.../a.23402767.../1926317934389921/
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය ඍජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

# "අරගලය" අදාළ ද?

ETHICS EYE

පිටු මායිමෙන් ඔබ්බට

## අරගල ලොක්කාගේ ජංගම ගණිකා මඩම මාට්ටු

සැකකරු ජනාධිපති මන්දිරයට, ජනාධිපති ලේකම් කාර්යාලයටත්, පා.ම. ජගත් කුමාරගේ නිවෙසට පහර දීම, මොරටුව නගරාධිපතිගේ නිවෙසට පහර දී ගිනි තැබීමේ ප්‍රමුඛයෙක්

දිනමිණ

## අරගලයේ සංවිධායකයකුගේ ගණිකා ජාවාරම වටලයි

ලංකාදීප

## මොරටුව අරගලකරුගේ රෝද හතරේ ගණිකා ජාවාරම

අරුණ

## ෂෝට් ලීව් දමා කාර්යාල සේවිකාවන් ගණිකා ව්‍යාපාරයේ යොදන ජාවාරමක්

මව්බිම

මැයි 23, 2023 දින තෝරාගත් සිංහල පුවත්පත් සිරස්තල දත්ත ඇසුරිණි